| මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| දෙවන වාර පරීක්ෂණය - 2018 | | |
| නර්තනය | 11 ශ්‍රේණිය | කාලය පැය එකකි |

**නම: ................................................................**

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) චරිත නිරූපණයේ දී වඩාත් අවශ්‍ය වන්නේ,

i. භාව ප්‍රකාශනයයි. ii. සංගීතයයි.
iii. සිද්ධියක් ගොඩනැගීමයි. iv. නර්තනයයි.

2) වෘත්තියක් පාදක කරගත් ගැමි නැටුමක් වන්නේ,

i. රබන් නර්තනයයි. ii. පන්තේරු නර්තනයයි.
iii. මෝල්ගස් නර්තනයයි. iv. කඩු නර්තනයයි.

3) දොඹින පද කුමන නර්තන සම්ප්‍රදායට අයත් සරඹවේද?

i. සබරගමු සම්ප්‍රදායට. ii. උඩරට සම්ප්‍රදායට.
iii. රයිගම් සම්ප්‍රදායට. iv. පහතරට සම්ප්‍රදායට.

4) බෙර සරඹ වාදනයේ දී අවධානය යොමු කළ යුත්තේ,

i. කණ්ඩායකම්. ii. ත්‍රිවිධලය
iii. වාදනයක් iv. නර්තනයක්.

5) පැරණි රාජධානි සමයේ සිට සිදු කළ ගායනා විශේෂයකි.

i. මෝල්ගස් කවි ii. කළගෙඩි කවි
iii. හටන් කවි. iv. කඩු කවි.

6) ''රන් විලි දෙකොණට සොඳින් තබන්නේ'' මෙම කවි පදය අයත් වන්නේ ............................ නැටුමටයි.

i. ගොයම්. ii. ලී කෙළි
iii. කුලු. iv. මෝල්ගස්

7) තාල තැබීමේ දී තාලස්ථාන දැක්වීම ........................................ නම් වේ.

i. ආඝාත ii. අනාඝාත. .
iii. ආතත iv. විතත.

8) කොහොඹා කංකාරියට සහභාගීවන ප්‍රධාන ඇදුරන් හඳුන්වන්නේ,

i. ආතුරයන් නමිනි. . ii. යක් දෙස්සන් නමිනි. .

iii. අතෝරකරුවන් නමිනි. iv. කොට්ටෝරුවන් නමිනි.

9) ''පත්තිනි දෙවිඳුගේ සළඹ වළල්ලා... '' මෙය,

i. ග්‍රහපන්ති කවියකි.. ii. ප්‍රශස්ති කවියකි.

iii. හටන් කවියකි. iv. පන්තේරු කවියකි.

10) සිංහලයේ මුල්ම ප්‍රශස්ති කාව්‍ය යනුයේ,

i. පැරකුම්බා සිරිතයි. . ii. ශ්‍රී නාමයයි.

iii. දුනුවිල හටනයයි. iv. ඇහැලේපොල හටනයි.

11) ''මෙම ගිම්හාන ග්‍රීම වූ කාලේ..' ගීතය රචනා කර ඇත්තේ,

i. බන්දුල ජයවර්ධන මහතා. ii. නීතීඥ චාර්ලිස් වයස් මහතා.

iii. ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි. iv. නීතීඥ ජෝන් ද සිල්වා මහතා.

12) ග්‍රහ පන්ති කවි ගායනයේ දී තාල තැබීම සඳහා යොදාගනු ලබන්නේ,

i. තාලම්පටයි. ii. ගැටබෙරයයි

iii. අත්මිණියයි. iv. හොරණෑවයි.

13) කවිකාර මඩුවේදී රචනා වූයේ,

i. පහතරට වන්නම්ය. ii. උඩරට වන්නම්ය.

iii. සබරගමු වන්නම්ය.. iv. රුහුණු වන්නම්ය.

14) උඩරට වන්නම් රචනා කරන ලද්දේ,

i. අන්ධ බමුණෙක් ය. ii. සේදරමන් මහතාය. .

iii. ගණිතාලංකාර බමුණාය. iv. නරේන්ද්‍රසිංහ රජුය.

15) විෂ්ණු දෙවියන්ගේ ගුණ වර්ණනා කළේ,

i. උඩරට වන්නම් වලය. ii. පහතරට වන්නම් වලය.

iii. සබරගමු වන්නම් වලය. iv. රුහුණු වන්නම් වලය.

16) ශ්‍රී ලංකාවේ නර්තන කලාවට විශාල පුනරුදයක් ඇති වූයේ ............................. පැමිණීමෙන් පසුවය.

i. උදය ශංකර් මහතා. ii. රවීන්ද්‍රනාත් තාගෝර් මහතා.

iii. ශ්‍රී නාරායන් මහතා. iv. සූර්ය කුමාර් මහතා.

17) මහා සම්මත රජුගේ බිරිඳට උපන් දොළදුක සංසිඳවීම උදෙසා කරනු ලැබුවේ .......................... ය.

i. කෝලම්. ii. සොකරි.

iii. ගම්මඩුව. iv. දෙවොල් මඩුව.

18) රජයේ පාසල් වල නර්තන විෂය අනිවාර්යය වීම සිදුවූයේ ....................... වර්ෂයේ දීය.

i. 1952. ii. 1972. iii. 1978. iv. 1945

19) ප්‍රායෝගික අභ්‍යාස කිරීමේ දී සිව්ගුණ වශයෙන් හඳුන්වන්නේ ............................ ලයට නැටීමය.

i. ද්‍රැත. ii. විලම්භ. iii. මධ්‍ය. iv. අධිද්‍රැත

20) ''යුද්දෙටත් ඇවිත් සිඳුපිට නැව් නැගලා'' මෙහි සැදැස්මත් ගණන,

i. 20 කි. ii. 18 කි. iii. 24 කි. iv. 30 කි.

21) කෝලම් නාටකයේ එන අති මානුෂ චරිත ලෙස ........................... හැඳින්විය හැකිය.

i. මුදලි, ආරච්චි, පොලිස්. ii. මරු රාක්ෂ, ලෙන්චිනා, සුරන්සිනා.

iii. කොටි, සිංහ, ගුරුළු රාක්ෂ. iv. නාග රාක්ෂ, නාග කන්‍යා, ගුරුළු රාක්ෂ.

22) ''සිහින් සිනිඳු සළුව පැලද'' මෙය .................................. කවියකි.

i. කඩතුරා. ii. මෝල්ගස්. iii. පන්තේරු. iv. ප්‍රශස්ති.

23) චරිතයට උචිත පරිදි වෙස් ගැන්වීම ............................... නමින් හැඳින්වේ.

i. රංග වස්ත්‍රාභරණ. ii. පසුතල නිර්මාණ.

iii. අංග රචන. iv. අංග හාර.

24) ගායනය රහිත නර්තන අංගයක් ලෙස ............................ නම් කළ හැකිය.

i. වට්ටම්. ii. වන්නම්. iii. සවුදම්. iv. කරණම්.

25) නර්තනය ප්‍රධාන කොටගෙන චරිත නිරූපණය සිදු කෙරෙන්නේ, ......................... වලදී ය.

i. ගීත නාට්‍ය. ii. මුද්‍රා නාට්‍ය.

iii. තාත්වික නාට්‍ය. iv. ශෛලිගත නාට්‍ය

- අංක 26 සිට 32 දක්වා ප්‍රශ්නවලට පිළිතුර සැපයීම සඳහා වගුව භාවිතා කරන්න.

| | | |
|---|---|---|
| රජයේ ලලිත කලායතන | වන්නම් 32 කි | ගිරාගම ගුරු විද්‍යාලය |
| දොඹින පද | දඹදෙනි යුගය | වන්නම් 24 කි. |
| සැවුලා වන්නම | ඉලංගම් | මුසලඩි වන්නම |
| වන්නම් 18 කි. | සෞන්දර්ය විශ්වවිද්‍යාලය | නෛයඩි වන්නම |

26) නර්තන ගුරුවරුන් පුහුණු කරන ආයතන .................................................................. වේ.

27) පහත රට සින්දු වන්නම්, ගණනින් ............................................. කි.

28) නර්තන විෂය හැදෑරීමට 2005 වර්ෂයේ දී ආරම්භ කළ ආයතනය කුමක්ද?

.....................................................

29) මාත්‍රා 2 + 4 දෙතිතට අයත් වන්නමකි. ...........................................................................

30) පහතරට අත් සරඹ හඳුන්වන්නේ ................................................................ සරඹ නමිනි.

31) 1952 නර්තන කලාව ඉගෙනීම සඳහා ආරම්භ කළ ආයතනයකි. ..................................................................

32) පහතරට හා සබරගමු වන්නම් රචනා වූ යුගය වන්නේ, ..................................................................

33) මාත්‍රා 3 + 4 හා 3 + 3 තාල රූපවලට නර්තනය කරනුයේ,

i. සැවුලා වන්නමයි.　　ii. සිංහරාජ වන්නමයි.

iii. මුසලඩි වන්නමයි.　　iv. තුරඟා වන්නමයි

34) ''දොං ජිං ජිං තකට දොංතක'' යන බෙර පදය අයත් වන තාල රූපය වන්නේ,

i. මාත්‍රා 3 + 4 දෙතිතටය.　　ii. මාත්‍රා 2 + 4 දෙතිතටය .

iii. මාත්‍රා 2 + 3 දෙතිතටය .　　iv. මාත්‍රා 4 + 3 දෙතිතටය

35) මාත්‍රා 2 + 2 + 4 තාල රූපයට නර්තනය කරනු ලබන වට්ටමකි,

i. කුදංත ගත දොං.　　ii. දොං ජිංත ගත දොංත.

iii. කුද කුජි ගත.　　iv. දොගර ජිංත ගත

36) දො දොංත තකු දොං බෙර පදය අයත් වන්නේ,

i. සුළු මැදුම් දෙතිතට.　　ii. මහ තනි තිතට.

iii. මැදුම් මහ දෙතිතට.　　iv. මැදුම් තනි තිතට

37) මුසලඩි වන්නමට අයත් කවි පද කොටසකි.

i. දුටත් යනෙන විටත් දුවන.　　ii. පෙරත් කලෙක සිහ රජෙක්.

iii. සත් වෙත් මහත් අදර.　　iv. සුරිඳුන් පෙර සිටන්.

38) දොං ජිංත ගත දොංත වට්ටම අයත් තාල රූපය,

i. මාත්‍රා 2 + 4 දෙතිත වේ.　　ii. මාත්‍රා 3 + 4 දෙතිත වේ.

iii. මාත්‍රා 2 + 3 දෙතිත වේ.　　iv. මාත්‍රා 4 + 4 දෙතිත වේ

39) තත් තකට තක රොං යන අඩව්ව නටනුයේ,

i. සිංහරාජ වන්නමට ය.　　ii. සැවුලා වන්නමට ය.

iii. නෛයඩි වන්නමට ය.　　iv. තුරඟා වන්නමට ය.

40) කොහොඹා කංකාරියේ පුද ලබන ප්‍රධාන දෙවිවරුන් වන්නේ,

i. කොහොඹා දෙවියන් හා බණ්ඩාර දෙවියන් ය.

ii. වීරමුණ්ඩ දෙවි හා මංගර දෙවියන් ය.

iii. කොහොඹා දෙවි හා දෙවොල් දෙවියන් ය.

iv. වීරමුණ්ඩ දෙවි හා දැඩිමුණ්ඩ දෙවියන් ය.

| මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| දෙවන වාර පරීක්ෂණය - 2018 | | |
| නර්තනය | 11 ශ්‍රේණිය | කාලය පැය දෙකකි |

## II කොටස

- පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

1)

i. නර්තනය හා චිත්‍ර යන විෂයන් දෙකටම පොදු වූ අංග ලක්ෂණය ................................ වේ.

ii. සෑම චරිතයක් සඳහාම වෙස් මුහුණු පැළඳමින් පිරිමින් පමණක් චරිත නිරූපණය කරන්නේ ............... රඟමඩලේදීය.

iii. ''මණ්ඩම'' නමින් හඳුන්වනු ලබන කොටස අයත් අවනද්ධ භාණ්ඩය .................... නමින් හැඳින්වේ.

iv. නර්තනය ප්‍රධාන මාධ්‍ය කොට ගෙන චරිත නිරූපණය සිදු කරන නාට්‍ය විශේෂය ......................... නම් වේ.

v. දෙවියන්ට ආරාධනා කිරීම හා ආශිර්වාදය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ...................වාදනය කෙරේ.

vi. අත්භූත රසයට භාවය වන්නේ, ............................................. යි.

vii. '' ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට'' මෙය ................................................... කවියකි.

viii. කෝලම් නාටකයේ චරිත නිරූපණය සඳහා ශාස්ත්‍රීය පද යොදා ගෙන ඇත්තේ .................................. නර්තන සම්ප්‍රදායෙනි.

ix. පිළිවෙලින් රංග රචනය හා ගීත ගායනය අයත් අභිනයන් වන්නේ,

1. .................................................... 2. .........................................................

x. විසිවන සියවසේ මුල් භාගයේ උඩරට නර්තන කලාවේ වෙස් බැඳි කාන්තාවන් දෙදෙනෙකි.

1. ..................................................... 2. .........................................................

2)

i. මුසලඩි වන්නමේ බෙර පදය අදාළ තාල රූපයට ප්‍රස්ථාර කරන්න. (ල. 04)

ii. කුදංත ගත දොං වට්ටමේ එන අඩව්වක් ප්‍රස්ථාර කරන්න. (ල. 05)

iii. මෝල්ගස් නැටුමට අයත් කවියක් ලියන්න. (ල. 03)

3)

i. වන්නම්වල පොදු ලක්ෂණ හතරක් ලියන්න. (ල. 04)

ii. උඩරට වන්නම් රචනා වීමට තුඩුදුන් හේතු දක්වන්න. (ල. 04)

iii. 1972 පසු නර්තන කලාවේ නූතන ප්‍රවණතා විස්තර කරන්න. (ල. 04)

4)

i. කෝලම් නාටකය අතීතයේ හා වර්තමානයේ පැවැත්වීමට හේතු දෙකක් සඳහන් කරන්න. (ල.04)

ii. කෝලම් රඟමඩල පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 03)

iii. කෝලම් නාටක චරිත මඟින් සමාජ විවරණයක් සිදු කෙරෙන ආකාරය විස්තර කරන්න. (ල. 05)

5)

i. නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබුන බවට සඳහන් ග්‍රන්ථ දෙකක් නම් කරන්න . (ල. 02)

ii. ඉන් එක් ග්‍රන්ථයක සඳහන් සාධකයක් පිළිබඳ විමසීමක් කරන්න. (ල. 04)

iii.ආගමික කටයුතු සඳහා නර්තනය යොදා ගත් බවට විදේශිකයන්ගේ වාර්තාවක් ඇසුරින් කරුණු ඉදිරිපත් කරන්න. (ල. 06)

6) නව නර්තන නිර්මාණ, නර්තන කලාවේ ප්‍රගමනයට හේතු වන අයුරු විස්තර කරන්න. (ල. 12)

7) '' නූතන තාක්ෂණ ක්‍රම ශිල්ප භාවිතය මඟින් නර්තන අංගයන් හී ප්‍රාසාංගිකත්වය ඉස්මතු කොට දැක්විය හැකිය.'' අදහස් දක්වන්න. (ල. 12)